# PAFFREL

**නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.**

**சுதந்திரமானதும் நீதியானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.**

**PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS**


2015.07.17

පොලිස්පති තුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

පොලිස්පති තුමනි,

**<u>2015.07.15 දින රාත්‍රී 12.00 ට පමණ කලවාන පොලිසියට කඩා වැදී සැකකරුවෙකු පැහැර ගෙනයාම හා අදාළ ජනරාශිය මෙහෙය වූ පුද්ගලයන් අත්අඩංගුවට ගැනිම</u>**

මෙවර පාර්ලිමේන්තු මැතිවරණයේ ප්‍රචාරක කටයුතු ආශ්‍රිතව රත්නපුර දිස්ත්‍රික්කයේ කලවාන ප්‍රදේශයේ 14 වන දින ආත්‍රී 12.00 ට පමණ ඇතිවූ සිද්ධියක් මත කලවාන පොලිස් ස්ථානාධිපති වරයා සහ තවත් දෙදෙනෙකුගේ වැඩ තහනම් කර ඇති බව අප වෙත වාර්තා විය.

මෙම සිද්ධියට පාදක වූ එක්සත් ජනතා නිදහස් සංධානයේ කටවුට් එකක් ගිණිතැබීම ආශ්‍රිතව හා ඒ අවස්ථාවේදී පොලිස් නිලධාරීන්ගේ රාජකාරියට බාධා කිරීම් සැලකිල්ලට ගනිමින් පුද්ගලයෙක් අත්අඩංගුවට ගත් බවත්, ඔහු පොලිස් ස්ථානය වෙත රැගෙන ගිය බවත් වාර්තා වේ.

එහිදී එක්සත් ජාතික පක්ෂයේ ආධාර කරුවන් 150 ක් පමණ පිරිසක් පොලිස් ස්ථානය වෙත පැමිණ ඇති අතර පොලිස් ස්ථානයට ගල්මුල් ප්‍රහාරයක් එල්ල කිරීමට සූදානම් කර තිබූ බවද වාර්තා විය.

මැතිවරණයක් ආරම්භයේදීම දේශපාලන පක්ෂ හෝ ඔවුන්ගේ ආධාරකරුවන් නීතිය අතට ගෙන කටයුතු කිරීමට උත්සාහ කිරීම බරපතල තත්ත්වයකි. එබැවින් අප ඔබ තුමාගෙන් ඉල්ලා සිටින්නේ අදාළ පොලිස් ස්ථානාධිපතිවරයාට එරෙහිව ක්‍රියාමාර්ග ගත්තා සේම මෙම අයුතු ජනරාශිය සම්බන්ධයෙනුත් පොලිසියෙන් අදාළ සැකකරු මුදා ගැනීමට ක්‍රියාකිරීම සම්බන්ධයෙනුත් එයට නායකත්වය දුන් පිරිස් සම්බන්ධයෙනුත් කඩිනමින් නීතිය ක්‍රියාත්මක කරන ලෙසයි. මෙවැනි තත්වයන් ආරම්භයේදීම වළක්වා ගැනීමට ක්‍රියා කිරීමෙන් ඉදිරියේදී පුරවැසියන් නීතිය අතට ගැනීමේ තත්ත්වයන් වළක්වා ගැනීමට ද හැකිවනු ඇත.

එමෙන්ම දේශපාලනඥයන් පොලිස් ස්ථානවලට පැමිණ සැකකරුවන් මුදාගෙන යාම මෑතකාලයේ දකින්නට ලැබුණු ප්‍රවණතාවයක් වූ අතර ඉදිරියේදී එවැනි සිදුවීම් වැළැක්වීමට ඔබ තුමා දැඩි පියවර ගනු ඇතැයි අපි විශ්වාස කරමු.

ස්තුතියි.

මෙයට විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි,

විධායක අධ්‍යක්ෂ.

පිටපත් :- මැතිවරණ කොමසාරිස් තුමා, මැතිවරණ මහලේකම් කාර්යාලය

උනන්දුවක් දක්වන සෙසු ආයතන.


**# 12/3, Robert Terrace, Robert Gunawardana Mawatha, Colombo 06, Sri Lanka.**
**Tel : (+94) 11 2514441 / 11 2514442 Fax : (+94) 11 2514443**
**E-mail : paffrel@sltnet.lk Website : www.paffrel.lk**